# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: MF/CG/02 (Cir.)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2017.12.21

වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 02/2017

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්,
රාජ්‍ය බැංකු සහ රාජ්‍ය සමාගම් සභාපතිවරුන්,

## රජයේ මූල්‍ය නොවන වත්කම් කළමනාකරණය

## රජයට අයත් වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම

2017 ජුනි 28 දින නිකුත් කරන ලද වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2017 යටතේ වාර්තා වී ඇති තොරතුරු අනුව, වාහන භාවිතය සම්බන්ධයෙන් රජයේ ආයතනවලට අදාළ වන පොදු කරුණක් ලෙස වාහනවල ලියාපදිංචි අයිතිය පිළිබඳ පවතින ගැටලු හඳුනාගෙන ඇත.

02. අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි ප්‍රධාන අරමුණ වන්නේ රජයේ මූල්‍ය නොවන වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමට අවශ්‍ය වන මූලික පදනම සකස් කිරීමයි. ඒ අනුව, රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින්ම ලියාපදිංචි කර තිබීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. ඒ සඳහා, වාහන අයිතිය පිළිබඳ පවතින ගැටලු 2018 ජුනි 30 දිනට ප්‍රථම නිරාකරණය කර ගැනීම සඳහා පහත සඳහන් උපදෙස් අනුගමනය කළ යුතු අතර මෝටර් රථ ප්‍රවාහන පනතේ විධි විධාන වලට අනුකූලව අවශ්‍ය කටයුතු කළ යුතු ය.

i. ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන, ලියාපදිංචි අයිතිය ඇති ආයතනයේ එකඟතාවය මත, තම ආයතනයේ නමින් ලියාපදිංචි කරගැනීමට හෝ ලියාපදිංචි අයිතිය ඇති ආයතනය වෙත විධිමත්ව පවරාදීමට කටයුතු කළ යුතු ය.

ii. පරිහරණය කරනු ලබන නමුත්, දැනටමත් අහෝසි වී ඇති අමාත්‍යාංශ/ආයතන නමින් වාහනවල ලියාපදිංචි අයිතිය ඇති විටක අදාළ කාර්යය හා කර්තව්‍යයන් පැවරී ඇති නව අමාත්‍යාංශ/ආයතන වලට අදාළ වාහන පැවරීමට හෝ අදාළ ගැසට් නිවේදනයේ සඳහන් ක්‍රියාමාර්ග හෝ අදාළ වෙනත් රෙගුලාසි, චක්‍රලේඛ විධිවිධාන අනුව පවරා ගැනීමට කටයුතු කළ යුතු ය.

iii. රජයේ ආයතනවලට පරිත්‍යාග වශයෙන් ලැබී ඇති වාහන සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ආනයනය කර ඇති වාහන භාවිතය සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු ය.

(අ). භාවිතය ආර්ථිකමය වශයෙන් ඵලදායී වන්නේ නම් සහ අදාල බදු මුදල් ගෙවීම සඳහා අවශ්‍ය වන අරමුදල් එවැනි ආයතන සතු වන්නේ නම් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව වෙත අදාළ බදු මුදල් ගෙවා එම වාහනවල ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ සඳහා රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජනයෙන් යුත් කමිටුවක් මඟින් නිර්දේශ කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

(ආ). ඉහත (අ) යටතේ ලියාපදිංචි අයිතිය ලබා ගැනීමට නොහැකිවන වාහන පිළිබඳ තොරතුරු රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නියෝජනයෙන් යුත් කමිටුවක් මඟින් නිර්දේශ කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

iv. රාජ්‍ය ව්‍යවසාය සඳහා වන මාර්ගෝපදේශයේ 8.3.9 වගන්තිය යටතේ දැනටමත් උපදෙස් දී ඇති පරිදි රාජ්‍ය ව්‍යවසාය අරමුදල්වලින් මිල දී ගත් වාහන අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන විසින් භාවිතා නොකළ යුතු ය.

03. මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කරගැනීම් අවශ්‍ය වන්නේ නම්, කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයෙන් විමසිය හැකි වේ.

කොම්ප්ට්‍රොලර් ජනරාල්,
කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
මහලේකම් කාර්යාලය,
කොළඹ 01.

දුරකථන අංකය: 011 - 2151425
ෆැක්ස් අංකය: 011 - 2151417

04. රජයේ වත්කම් කළමනාකරණය රජයේ නිලධාරීන් විසින් ඉටුකළ යුතු ප්‍රමුඛ කාර්යයක් වන බැවින් ඉහත සඳහන් උපදෙස් අනුගමනය කරන ලෙස සියලු ම රාජ්‍ය ආයතන වෙත කාරුණිකව දන්වමි.

**ඒ.ආර්.දේශප්‍රිය**
**භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්**

පිටපත : විගණකාධිපති

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01. ශ්‍රී ලංකාව
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය - මුදල් / அலுவலகம் - நிதி / Office - Finance: (+94)-11-2484500, (+94)-11-2484600, (+94)-11-2484700
ෆැක්ස් - මුදල් / பெக்ஸ் - நிதி / Fax - Finance: (+94)-11-2449823
කාර්යාලය - ජනමාධ්‍ය / அலுவலகம் - வெகுசன ஊடக / Office - Mass Media: (+94)-11-2513459, (+94)-11-2513498, (+94)-11-2512324
ෆැක්ස් - ජනමාධ්‍ය / பெக்ஸ் - வெகுசன ஊடக / Fax - Mass Media: (+94)-11-2513458
වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: MF/CG/02(Cir)
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 21.12.2017

Assets Management Circular No: 02/2017

All Secretaries to Ministries,
Chief Secretaries of Provincial Councils,
Heads of Departments,
Heads of Public Corporations and Statutory Boards,
Chairmen of State Banks and Government owned Companies,

## Non-financial Assets Management of the Government

## Resolving Registered Ownership Issues of Government owned Vehicles

Registered ownership issues pertaining to the use of vehicles have been identified as a common factor for most of government agencies, as per the information reported under the Assets Management Circular No 01/ 2017 issued on 28th June 2017.

02) The main objective of the Assets Management Circular No: 01/2017 is to adhere to a systematic process to create the basic foundation for assets and cost management of the government. Accordingly, it is emphasized that each government agency should have registered ownership for each of the government owned vehicle used by them. For this purpose, necessary actions should be taken to resolve vehicle ownership issues before 30th June 2018 as per the instructions given below and adhering to the provisions of the Motor Traffic Act.

i. Vehicles used without registered ownership should be handed over to the respective registered owner or registered ownership should be obtained with the consent of the respective registered owner.

ii. In respect of use of vehicles registered under the Ministries/Institutions already dissolved, actions should be taken to hand over such vehicles to the respective duties and functions assigned Ministries/Institutions or registered ownership should be obtained as per the regulations stipulated in relevant gazette notification or other relevant regulations and circular instructions.

iii. In respect of use of vehicles donated to government agencies and vehicles imported for the use of development projects, following procedure should be adopted:

a. Registered ownership should be obtained by paying due taxes to the Department of Sri Lanka Customs, only if it is economically beneficial to use such vehicles and required funds are available in the relevant agency. For this purpose, relevant information recommended by an accredited committee comprised of the Secretary of the line ministry, should be submitted to obtain the approval of the Department of National Budget.

b. In respect of vehicles do not come under (a) above, relevant information recommended by an accredited committee comprised of the Secretary of the line ministry, should be submitted to the Comptroller General's Office.

iv. Ministries and other government organisations should not use vehicles purchased by public enterprises using their funds, as already instructed under the section 8.3.9 of the Guideline for Public Enterprises.

03) For further clarifications, please contact the Comptroller General's Office.

Comptroller General,
Comptroller General's Office,
Ministry of Finance and Mass Media,
The Secretariat,
Colombo 01.

Tel: 011 - 2151425
Fax: 011 – 2151417

04) As the management of public assets is a high priority activity for all government officials, all public organisations are kindly requested to adhere to above instructions.

**Sgd./ A.R Desapriya**
**Deputy Secretary to the Treasury**

Copy : Auditor General